# SUNIL WATAGALA
Attorney- at – Law, Notary Public & Commissioner for Oaths
NO. 192, Hulftsdorp Street, Colombo 12.
Mobile: 0772349348, 0718458711
sunilwatagala@yahoo.ie

**එන්තරවාසිය**

2023.08.22

සාගර කාරියවසම්
පාර්ලිමේන්තු මන්ත්‍රී (මහලේකම්) පොදුජන පෙරමුණ
අංක 1316, නෙලුම් මාවත,
ජයන්තිපුර, බත්තරමුල්ල.

මහත්මයාණෙනි,

**වර්ෂ 2023.08.19 වන දින මැද කොළඹ ප්‍රදේශයේ ජනතා හමුවකදී කරනු ලැබූ ප්‍රකාශයක් සම්බන්ධයෙනි.**

මාගේ සේවාදායකයා අංක.464/20,පන්නිපිටිය පාර, පැලවත්ත ස්ථානයේ පදිංචි අනුර කුමාර දිසානායක යන අයගේ උපදෙස් මත ඔබවෙත දන්වා සිටින වග නම්,

මගේ සේවාදායකයා ජනතා විමුක්ති පෙරමුණේ සහ ජාතික ජනබලවේගයේ නායකයා බවත් සහ ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කරන බවත් ය.

මාගේ සේවාදායකයාගේ උපදෙස් මත මා කියා සිටින්නේ 2023.08.19 වන දින කොළඹ දිස්ත්‍රික්කයේ, මැද කොළඹ ප්‍රදේශයේ පවත්වනු ලැබූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් දේශපාලන පක්ෂය මගින් සංවිධානය කරන ලද ජන හමුවකදී පහත ප්‍රකාශය ඔබ විසින් සිදු කර ඇති බවයි.

" බිලියන ගණන් සල්ලි ඇදලා මුල්‍යාමය වංචාවක් කරලා තියෙනවා කියන මේ චෝදනාව නගන්නෙ අපි නෙවෙයි ඔවුන් සමගම එකට හිටපු පෙරටුගාමී පක්ෂයේ දුමින්ද නාගමුව මහත්තයා දැන් කියනවා මේ චෝදනා ගෙනාවට මේවා ඔප්පු කරල පෙන්නන්න මං හිතන්නේ දිට්ඨ ධම්මවේදනීය කර්මය පඩිසන් දීල තියෙනවා."

මට ලැබී ඇති උපදෙස් පරිදි ඔබ විසින් එකී ජන හමුවේදී මගේ සේවාදායකයා සම්බන්ධයෙන් සදහන් කරනු ලැබූ සියල්ල විද්‍යුත් මාධ්‍ය, ප්‍රවෘත්ති පත්‍ර සහ වෙබ් මාධ්‍ය ඔස්සේ ශ්‍රී ලංකාව තුල සහ ලොව පුරා ප්‍රචාරය වී ඇත.

වැඩිදුරටත් මා ප්‍රකාශ කර සිටින්නේ ඔබ විසින් එසේ ජන හමුවක් පවත්වමින් මාගේ සේවාදායකයා සම්බන්ධයෙන් ප්‍රකාශ කල ඉහත සඳහන් සියලු කාරණා අසත්‍ය සහ ද්වේශසහගතව ප්‍රකාශ කිරීමට කටයුතු කර ඇති බවට මට උපදෙස් ලැබී ඇති බවත්ය.

මට ලැබී ඇති උපදෙස් පරිදි මා ප්‍රකාශ කර සිටින්නේ මගේ සේවාදායකයා ජනතා විමුක්ති පෙරමුණේ සහ ජාතික ජනබල වේගයේ නායකයා බවත් සහ ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රී වරයකු ලෙස රටෙහි වගකිව යුතු නිලයක කටයුතු කරන බවත් ඔබ විසින් සිදු කර ඇති පදනම් විරහිත අසත්‍ය සහ ද්වේශසහගත චෝදනා මගින් ඔහුට බරපතල අපහාසයක් සිදුව ඇති බවත් ඔහුගේ කීර්තිනාමයට මහත් වූ හානියක් සිදු වී ඇති බවත්ය. එසේම ඔහු කෙරෙහි ඇති මහජන විශ්වාසය, ගරුත්වය සහ පිළිගැනීම විනාශ කිරීමේ චේතනාවෙන් එම ප්‍රකාශය සිදු කර ඇති බවට මා වෙත වැඩිදුරටත් උපදෙස් ලැබී ඇති බවයි.

ඒ අනුව මා වෙත උපදෙස් ලැබී ඇත්තේ ඔබ විසින් මගේ සේවාදායකයා සම්බන්ධයෙන් 2013.08.19 වන දින ජන හමුවක් පවත්වමින් සිදු කරනු ලැබූ ද්වේශ සහ අසත්‍ය චෝදනා සම්බන්ධයෙන් මෙම එන්තරවාසිය ලැබී දින 14ක් ඇතුලත මාගේ සේවාදායකහට අත්විදීමට සිදු වනු ලැබූ අපකීර්තිය, ලැජ්ජාව හා අපහාස වෙනුවෙන් අලාභ ලෙස රුපියල් බිලියන දහයක මුදලක් මගේ සේවාදායකහට ගෙවන ලෙසත් එකී මුදල් ඔබ විසින් මෙම ලිපිය ලැබී දින 14ක් ඇතුලත ගෙවීමට අපොහසත් වුවහොත් ඉහත සඳහන් මුදල අය කරගැනීම සඳහා සිවිල් අධිකරණයක ඔබට විරුද්ධව නඩු පැවරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවට ඔබ වෙත මෙයින් දන්වා සිටීමට මා වෙත උපදෙස් ලැබී ඇති බවයි.

ස්තූතියි

මෙයට - විශ්වාසී

Suinl

සේවාදායකගේ නීතිඥ


සුනිල් වටගල එල්.එල්.බී (කොළඹ)
SCE No_A 11830
නීතිඥ, ප්‍රසිද්ධ නොතාරිස්,
සහ දිවුරුම් කොමසාරිස්
අංක. 192, අළුත්කඩේ වීදිය, කොළඹ - 12.
දු.ක. 071 8458 711, 077 2349 348
sunilwatagala@yahoo.ie